**ශීර්ෂය 265 - මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ඔක්තෝබර් 14 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ජේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායීත්වය

පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ සසඳා ඉදිරිපත් කර තිබුණි. එසේ වුවත්, ඉකුත් වර්ෂයෙ අදාල මූල්‍ය ප්‍රකාශන නියමිත අයුරින් පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. එමනිසා පසුගිය වර්ෂයේ අගයන්වල අනුරූපීභාවය තහවුරු කළ නොහැකි විය.

(ආ) මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ ආදායම් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(අ)** | **ආදායම් අග්‍රිම ලෙස ගිණුම්ගත නොකිරීම** | | |
| (i) | 2018 නොවැම්බර් 21 දිනැති අංක 264/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයට පටහැනිව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක් සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වර්ෂයට අදාළව එකතු කරනු ලැබූ ආදායම් රු.37,525,067 ක් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ඉදිරිපත් නොකර අග්‍රිම ගැලපුම් ගිණුමේ දක්වා තිබූ බව නිරීක්ෂණය විය. | අදාළ චක්‍රලේඛ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතු වේ. | ආදායම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ACA 1 යටතේ ඇතුළත් නොකළ යුතු නිසා සමුච්චිත ආදායම් භාණ්ඩාගාරයෙන් ලැබූ අග්‍රිම ලෙස සලකා ACA II හි දක්වන ලදී. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූලධන වත්කම් විකිණීමෙන් ලද රු.147,220 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ හෙළිදරව් කර නොතිබුණි. | පිළිගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුව කටයුතු කළ යුතුය. | මූලධන ආදායම් ලෙස දැක්විය යුතු වුවත්, ආදායම් නොවන වර්ගීකරණයන් තුළ දක්වා ඇත. ඉදිරි කාලයේදී නියමිත වර්ගීකරණය යටතේ දක්වනු ලැබේ. |

(ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළව අත්තිකාරම් ගිණුම් ශේෂ පරීක්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| නිලධාරීන් 06 දෙනෙකුගෙන් අයකළ යුතු හිඟ ණය රු.604,106 ක් වර්ෂ 01 සිට වර්ෂ 03 කට අධික කාලයක සිට හිඟ හිටව පැවැති නමුත් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4 වගන්තිය ප්‍රකාරව අයකර ගැනීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග කිසිවක් ගෙන නොතිබුණි. | ආයතන සංග්‍රහයට අනුව අයකරගැනීමට කටයුතු කළ යුතුය. | විශ්‍රාම යෑමේදී හා ඇපකරුවන්ගෙන් අයකිරීමට කටයුතු කරනු ලැබේ. |

**(ඈ) දේපල, පිරියත හා උපකරණ**

මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් දේපල, පිරියත හා උපකරණ පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව සියළුම මූලධන වත්කම් මිලදී ගැනීම්වල ශේෂය රු.37,675,623 ක් ලෙස හෙලිදරව් කර තිබූ නමුත් මූල්‍ය ප්‍රකාශනවල (ACA – 6) මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ මුළු වත්කම් මිලදී ගැනීම රු.7,675,628 ක් ලෙස දක්වා තිබුණි. | මෙම ශේෂ සැසඳීමට කටයුතු කළ යුතුය. | ප්‍රවර්තන වර්ෂ අවසන් ගිණුම්වල ගැලපීමට කටයුතු කරනු ලැබේ. |

**(ඇ) අතුරු අග්‍රිම ශේෂ**

මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාල අතුරු අග්‍රිම ශේෂ පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළ අක්මුදල් හිස් (0) ශේෂයක් ලෙස දක්වා තිබුණත් සටහන්වල (ACA-03) භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළ මුදල් රු.2,002,408,271 ක් දක්වා තිබුණි. | ශේෂ සැසඳීම් සිදු කළ යුතුව තිබුණි. | භාණ්ඩාගාරයට නිරවුල් කළ අක් මුදල් නොතිබූ නමුත් වැරදීමකින් ACA 3 හි ඇතුළත් විය. |

## 2. මූල්‍ය කළමනාකරණය

### 2.1 වියදම් කළමනාකරණය

මන්නාරම් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වියදම් කළමනාකරණය පිළිබඳව නිරීක්ෂණයන් පහත පරිදි විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අදාළ මුදල් වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වැය විෂයයන් 06 ක් සඳහා සලසා තිබූ ප්‍රතිපාදනයෙන් රු.6,989,843 ක ඉතිරිවීම් සියයට 7 සිට සියයට 27 දක්වා පැවතුණි. | ඵලදායී අයවැය පාලනයක් ක්‍රියාත්මක කළ යුතුය. | ඉදිරියේදී අයවැය පිළියෙල කිරීමේදී ඉතිරිවීම් අවම කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ආ) | වැය විෂයයන් 05 ක් සඳහා සලසා තිබූ ප්‍රතිපාදන එකතුව රු.4,800,000 ක් අදාළ වැය විෂයයන් වෙනුවෙන් උපයෝජනය නොකර මාරු කිරීම් මගින් ප්‍රතිපාදනයෙන් සියයට 50 ක් හෙවත් රු.2,271,281 ක් වෙනත් වැය විෂයයන් 03 ක් සඳහා මාරු කර තිබීම, අයවැය ඵලදායී ආකාරයෙන් පිළියෙල කර නොතිබූ බව අනාවරණය කෙරුණි. | ඵලදායී අයවැය පාලනයක් ක්‍රියාත්මක කළ යුතුය. | පිළිගෙන ඇත. ඉදිරියේදී අයවැය පිළියෙල කිරීමේදී නිවැරදි ආකාරයෙන් ගිණුම් ඇස්තමේන්තු කර පිළියෙල කිරීමට අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. |
| (ඇ) | වැය විෂයයන් 03 ක් සඳහා සලසා තිබූ රු.10,900,000 ක් අදාළ වැය විෂයයන් සඳහා ප්‍රමාණවත් නොවීම හේතුවෙන් සියයට 25 කට වැඩි වැය විෂයයන් 03 ක් සඳහා රු.3,123,281 ක් ප්‍රතිපාදන මාරු කිරීම් මගින් සලසා ගෙන තිබුණි. | ඵලදායී අයවැය පාලනයක් ක්‍රියාත්මක කළ යුතුය. | පිළිගෙන ඇත. ඉදිරියේදී අයවැය පිළියෙල කිරීමේදී නිවැරදි ආකාරයෙන් ගිණුම් ඇස්තමේන්තු කර පිළියෙල කිරීමට අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. |

### 2.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සිදුකළ යුතු තහවුරු කිරීම

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධානවලට අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහ ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් තහවුරු කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය පහසු කිරීම සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කොට ක්‍රියාත්මක කරගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් තහවුරු කළ යුතු වුවත්, එම පද්ධතියේ ඵලදායීතාවය සම්බන්ධයෙන් කාලයෙන් කාලයට එම පද්ධතිය සමාලෝචනයන් සිදු කොට ඒ අනුව පද්ධතියක් ඵලදායීව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වෙනස්කම් සිදුකළ යුතුය. එසේ වුවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කොට එහි පිටපතක් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කළ යුතු වුවත්, එවැනි සමාලෝචනයක් සිදුකොට ප්‍රකාශනයක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධානවලට අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහ ගණන්දීමේ නිලධාරී විසින් කටයුතු කළ යුතුය. | අනාගතයේදී ක්‍රියාමාර්ග ගනු ලැබේ. |
| විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 3.6 ඡේදය ප්‍රකාරව එක් විගණන විමසුමකට පිළිතුරු ලබා දී නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | පිළිගෙන ඇත. ඉදිරියේදි මෙවැනි දෝෂයන් සිදු නොවන අයුරින් නිවැරදි කරනු ලැබේ. |

## 2.3 නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම්

නියැදි විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම් අවස්ථා පහත විශ්ලේෂණය කර දැක්වේ.

| විගණන නිරීක්ෂණය | | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| නීති, රීති. රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | | |
| | රු. | | | |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | | |
| (i) මුදල් රෙගුලාසි 570, 571 | 2,309,500 | කල් ඉකුත් වූ තැන්පතු 31ක් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අදාළ මුදල් රෙගුලාසි විධිවිධානවලට අනුව කටයුතු කළ යුතුය. | වර්ෂ 02 කට වැඩි කල් ඉකුත් වූ තැන්පතු සඳහා කටයුතු කරනු ලැබේ. |
| (ii) මුදල් රෙගුලාසි 137, 138 | 3,177,511 | කොන්ත්‍රාත් කාර්යයන් සහ සේවාවන් ලබා නොගෙන මඩු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් චෙක්පත් 05 ක් ලියා තිබුණි. | මුදල් රෙගුලාසි විධිවිධානවලට අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය. | සැලැස්ම සඳහා මුළු ඇස්තමේන්තු ප්‍රතිපාදන මුදලම ප්‍රතිලාභියාගෙන් ලබාගැනීමෙන් පසුව ජාතික ජල සම්පාදන හා මලපවහන මණ්ඩලයේ මෙහෙයුම් සැලැස්මට අනුව කාර්යයන් ක්‍රියාත්මක කිරීම සාමාන්‍ය සිරිත බව ජාතික ජල සම්පාදන හා මලපවහන මණ්ඩලය විසින් දන්වා තිබුණි. |
| (ආ) අමාත්‍යාංශ චක්‍රලේඛ, විධිවිධාන, රෙගුලාසි | | | | |
| (i) බන්ධනාගාර, ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශ ලේකම්වරයාගේ 2016 පෙබරවාරි 09 දිනැති අංක MR/4/31 දරන ලිපිය | 95,072 | නානාට්ටන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් වර්ග 04 ක ජීවනෝපාය ආධාර පැකේජ මඟින් ප්‍රතිලාභීන් 45 දෙනෙකුට ජීවනෝපාය සහනාධාර පැකේජ වැඩිපුර ලබා දී තිබුණි. | අදාළ චක්‍රලේඛ උපදෙස්වලට අනුව කටයුතු කළ යුතුය. | ක්‍රියාමාර්ග ගෙන ඇත. යථා කාලයේදී පිළිතුරු ඉදිරිපත් කෙරේ. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ii) | බන්ධනාගාර, ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශ ලේකම්වරයාගේ 2016 පෙබරවාරි 09 දිනැති අංක MR/4/31 දරන ලිපියේ 3 ඡේදය සහ ආණ්ඩුකාරවරයාගේ අංක NN/GA/PL/COM/ R/00/2016 දරන 2017 ලිපිය | 685,000 | මාන්තායි බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ප්‍රතිලාභීන් 08 දෙනෙකුට පශු සම්පත් ලබා දිය යුතු වුවත්, මුදල් ගෙවා තිබුණි. | අදාළ චක්‍රලේඛ උපදෙස්වලට අනුව කටයුතු කළ යුතුය. | අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී මෙවැනි දෝෂ වලකාලීමට කටයුතු කරනු ලැබේ. |
| (iii) | උතුරු පළාත් පශු සම්පත්, නිෂ්පාදන සෞඛ්‍ය දෙපාර්තමේන්තු පළාත් අධ්‍යක්ෂවරයාගේ 2016 මාර්තු 17 දිනැති අංක 01/2016 දරන චක්‍ර ලේඛය | 13,212,500 | (i) නානාට්ටාන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ප්‍රතිලාභීන් 151 දෙනෙකු සඳහා ගවයන්, මිල ගණන් තීරණය නොකර මුරුංගන් රජයේ පශු සම්පත් වෛද්‍යවරයා විසින් මිලදී ගෙන තිබුණි. | අදාළ චක්‍රලේඛ උපදෙස්වලට අනුව කටයුතු කළ යුතුය. | අදාළ ප්‍රාදේශීය ලේකම්වරයාට උපදෙස් ලබා දී මෙවැනි දෝෂ වලක්වා ගැනීමට කටයුතු කරනු ලැබේ. |
| | | 11,900,000 | (ii) මාන්තායි බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කිරි ගවයන් 36 ක් මිල ගණන් තීරණය නොකර මිලදී ගෙන තිබුණි. | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| (iv) | උතුරු පළාත් පශු සම්පත් නිෂ්පාදන සෞඛ්‍ය දෙපාර්තමේන්තු පළාත් අධ්‍යක්ෂවරයාගේ 2014 පෙබරවාරි 09 දිනැති අංක 04/2014 දරන චක්‍රලේඛය | 199,800 | (i) | මාන්තායි බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ප්‍රතිලාභීන් දෙදෙනෙකුට එළුවන්ගේ මිල ගණන් තීරණය නොකොට මිලදී ගැනීම් සිදු කර තිබුණි. | අදාළ චක්‍රලේඛ උපදෙස්වලට අනුව කටයුතු කළ යුතුය. | අදාළ ප්‍රාදේශීය ලේකම්වරයාට උපදෙස් ලබා දී මෙවැනි දෝෂ වලක්වා ගැනීමට කටයුතු කරනු ලැබේ. |
| | | 2,160,000 | (ii) | නානාට්ටාන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ප්‍රතිලාභීන් 24 දෙනෙකුට එළුවන්ගේ මිල ගණන් තීරණය නොකර මිලදී ගැනීම් සිදු කර තිබුණි. | | |
| (v) | උතුරු පළාත් පශු සම්පත් නිෂ්පාදන, සෞඛ්‍ය දෙපාර්තමේන්තු පළාත් අධ්‍යක්ෂවරයාගේ 2015 ජුලි 05 දිනැති අංක NP/26/02/C/R/2016 /02 දරන චක්‍ර ලේඛය | 161,500 | | මාන්තායි බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් වැඩි වූ මිල ගණන්වලින් ප්‍රතිලාභීන් 17 දෙනෙකුට කිකිළි පැටවුන් 1,700 ක් මිලදී ගෙන තිබුණි. | අදාළ චක්‍රලේඛ උපදෙස්වලට අනුව කටයුතු කළ යුතුය. | පිළිගෙන ඇත. ක්‍රියාමාර්ග ගනිමින් පවතී. යථා කාලයේදී පිළිතුරු ලබාදෙනු ලැබේ. |

## 2.4 අවිධිමත් ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නානාට්ටාන්, මුසලි පශු සම්පත් අභිජනනය කිරීමේ සංගමයට සේවා ගාස්තු ලෙස රු.500 ක් ලබා දිය යුතු බව කිසිඳු ආකාරයක ගිවිසුමක් හෝ ලිපි ලේඛන නොමැතිවුවත් කිරි ගවයන් ලබා දුන් ප්‍රතිලාභීන්ගෙන් නානාට්ටාන්, මුසලි පශු සම්පත් අභිජනන සංගමය (LIBCO) සෑම ප්‍රතිලාභියෙකුගෙන්ම රු.500 බැගින් ප්‍රතිලාභීන් 151 දෙනෙකුගෙන් රු.75,500 ක් අයකර ගෙන තිබුණි. | ගිවිසුමේ සඳහන් නොවූ කිසිඳු මුදලක් ප්‍රතිලාභීන්ගෙන් අයකළ නොහැක. | සම්බන්ධිත අය සමඟ සාකච්ඡා කොට යථා කාලයේදී පිළිතුරු ලබා දෙනු ලැබේ. |

## 2.5 වංචනික ස්වරූපයේ ගනුදෙනු

නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ වංචනික ස්වරූපයේ ගනුදෙනු පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂයේ කුඩා ඇඟළුම් හස්ත කර්මාන්ත පිහිටුවීම සඳහා හස්ත කර්මාන්ත හා වානිජ අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලැබූ මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාල බල ප්‍රදේශයට අයත් මැහුම් මධ්‍යස්ථාන 15 කින් පෙරියගමම් සහ පනංකට්ටුකොට්ටු යන මැහුම් පුහුණු මධ්‍යස්ථාන 02 ම 2019 පෙබරවාරි 28 දින වන විටත්, ආරම්භ නොකර තිබූ අතර, අදාළ මැහුම් පුහුණු මධ්‍යස්ථාන 02 ට අයත් මහන මැෂින් 152 ක් සහ ලී බඩු අදාළ මධ්‍යස්ථානවල දක්නට නොවීය. | සඳහන් කාලපරිච්ඡේදය තුළ යන්ත්‍ර භාරදිය යුතු වේ. | දැනට අදාළ යන්ත්‍ර ලබා දී මැහුම් පුහුණුවීම් අවසන් වී ඇත. |
| (ආ) | බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයේ ජීවනෝපාය ආධාර | | |

| | | | |
|---|---|---|---|
| | වැඩසටහන 2016 - නානාට්ටාන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය රු.මිලියන 22 ක වටිනාකමකින් නානාට්ටාන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කරන ලද මෙම වැඩසටහන සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (i) | මුරුංගන් රජයේ පශු වෛද්‍ය අධිකාරීවරයා විසින් එකක් රු.87,500 බැගින් ප්‍රතිලාභීන් 151 දෙනෙකුට කිරි ගවයින් (රු.87,500x151) රු.13,212,500 කට මිලදී ගෙන තිබුණත්, නානාට්ටාන්, මුසලි පශු සම්පත් අභිජනන සංගමයේ නමට (LIBCO) චෙක්පත් ලියා ගෙවීම් සිදු කර තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුව කටයුතු කළ යුතු වේ. | ක්‍රියාමාර්ග ගෙන ඇත. යථා කාලයේදී පිලිතුරු ලබාදෙනු ලැබේ. |
| (ii) | මුරුංගන් රජයේ පශු වෛද්‍ය අධිකාරිවරයාගේ උපදෙස් අනුව, නානාට්ටාන්, මුසලි පශු සම්පත් අභිජනන සංගමය විසින් (LIBCO) මුරුංගන් රජයේ පශු වෛද්‍ය අධිකාරී කාර්යාල සේවකයන් තිදෙනෙකුගේ නමින් රු.7,525,000 ක් වටිනා චෙක්පත් ලියා අදාළ සේවකයන් විසින් චෙක්පත් මාරු කර මුදල් ලබාගැනීම පිළිබඳව අදාළ බැංකු ශාඛා කළමනාකරු විසින් තහවුරු කර ඇත. | සැපයුම්කරුගේ නමට සෘජුවම චෙක්පත් ලිවිය යුතු වේ. | විමර්ශන කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතී. යථා කාලයේදී පිලිතුරු ලබාදෙනු ලැබේ. |
| (iii) | මුරුංගන් රජයේ පශු වෛද්‍ය අධිකාරිවරයාගේ උපදෙස් අනුව, නානාට්ටාන්, මුසලි පශු සම්පත් අභිජනන සංගමය විසින් (LIBCO) ප්‍රතිලාභීන් 07 දෙනෙකුගේ නමින් රු.4,025,000 ක චෙක්පත් ලියා, මුදල්, මුරුංගන් රජයේ පශු වෛද්‍යවරයා විසින් ලබාගෙන තිබුණි. | ප්‍රතිලාභීන්ගේ නමට චෙක්පත් ලිවිය නොහැක. තවද, සැපයුම්කරුගේ නමට පමණක් චෙක්පත් සෘජුවම ලිවිය යුතු වේ. | විමර්ශන කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතී. යථා කාලයේදී පිලිතුරු ලබාදෙනු ලැබේ. |
| (ඇ) | බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයේ ජීවනෝපාය ආධාර | | |

| | | | |
|---|---|---|---|
| | වැඩසටහන (2016) රු.මිලියන 32.5 කින් මාන්තායි බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (i) | ජීවනෝපාය ආධාර වැඩසටහන සඳහා පශු සම්පත් මිලදී ගැනීම සඳහා මන්නාරම දිස්ත්‍රික් මාන්තායි බටහිර පශු වෛද්‍ය අධිකාරීවරයා විසින් 2016 ජුලි 11 දින පිළියෙල කළ ඇස්තමේන්තුව අනුව, වයස 3-6 අතර බර 250 – 280 kg අතර කිරි ගවයෙකුගේ මිල රු.84,000 සිට රු.90,000 ක් දක්වා ඇස්තමේන්තු කර තිබුණි. අදාළ කොන්දේසිවලට අනුකූල වූ කිරි ගවයින් මිලදී ගැනීම සඳහා ප්‍රතිලාභීන් දෙදෙනෙකුගෙන් ඇස්තමේන්තුගත වටිනාකමට අමතරව රු.30,000 ක් මාන්තායි බටහිර පශු වෛද්‍ය අධිකාරීවරයාට ලබා දුන් බවට ප්‍රතිලාභීන් විසින් සඳහන් කර ලිඛිතව තහවුරු කර තිබුණි. | ගිවිසුමේ සඳහන් නොවූ ගෙවීම් සිදුකළ නොහැක. | විමර්ශන කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතී. යථා කාලයේදී පිලිතුරු ලබාදෙනු ලැබේ. |
| (ii) | මාන්තායි බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2016 වර්ෂය සඳහා ජීවනෝපාය වැඩසටහන සඳහා ගවයින්, එළුවන්, කිකිලියන් ආදිය මිලදී ගැනීම සඳහා නානාට්ටාන්, මුසලි පශු සම්පත් සමූපකාර සමිතියෙන් මිලදී ගැනීම සඳහා ගෙවීම් සිදු කර තිබුණත් මාන්තායි බටහිර පශු වෛද්‍ය අධිකාරිගේ පෞද්ගලික නමට රු.2,206,750 ක් වටිනා චෙක්පත් ලියා තිබුණි. | සැපයුම්කරුගේ නමට පමණක් චෙක්පත් ලිවිය යුතුය. තවද, විධිමත් විමර්ශනයන් ක්‍රියාත්මක කළ යුතුය. | විමර්ශන කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතී. යථා කාලයේදී පිලිතුරු ලබාදෙනු ලැබේ. |
| (iii) | සැපයුම්කරුගේ නමට සෘජුවම චෙක්පත් ලිවිය යුතු වුවත් පශු වෛද්‍ය අධිකාරීයාගේ නමට මන්නාරම ලංකා බැංකුව මාර්ගයෙන් රු.318,000 ක් 2016 පෙබරවාරි 28 දින මුදල් තැන්පත් කර තිබූ බව මුදල් තැන්පතු රිසිට් පිටපත (slip) මඟින් තහවුරු වී තිබුණි. | සැපයුම්කරුගේ නමට පමණක් චෙක්පත් ලිවිය යුතුය. තවද, විධිමත් විමර්ශනයන් ක්‍රියාත්මක කළ යුතුය. | විමර්ශන කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතී. යථා කාලයේදී පිලිතුරු ලබාදෙනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අරමුදල් රු.2,516,812 ක් වටිනා චෙක්පත් 121 ක් වංචනික ආකාරයෙන් මාන්තායි බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කළමනාකරණ සහකරු විසින් 2014 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා ලබාගත් මුදල් පිළිබඳව රු.1,809,827 ක් වටිනා චෙක්පත් 80 ක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් තහවුරු කර තිබූ අතර රු.706,985 ක් වටිනා චෙක්පත් 41 ක් 2019 අප්‍රේල් 30 දින දක්වා තහවුරු කර ගෙවීම් සිදු කර නොතිබුණි. තවද, මෙම වංචාව සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | වංචා සම්බන්ධයෙන් විධිමත් තීරණයක් ගත යුතු වේ. එසේම රජයේ අරමුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගත යුතුය. | මූලික පරීක්ෂණ ආරම්භ කර ඇත. අමාත්‍යාංශයෙන් උපදෙස් ලැබූ වහා වැඩිදුර ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඇතැම් ව්‍යාපෘති ඉටුකිරීමේ දී සිදු වූ ප්‍රමාදයන් සම්බන්ධයෙන් නිරීක්ෂණයන් පහත පරිදි වේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂය සඳහා ගම් පෙරළිය වැඩසටහන සඳහා සලසා තිබූ ප්‍රතිපාදනයෙන් ක්‍රියාත්මක කළ යුතුව තිබූ ව්‍යාපෘති 43 න් රු.මිලියන 09 ක් වටිනා ව්‍යාපෘති 04 ක් නානාට්ටාන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉටු කර නොතිබුණි. | අදාළ මූල්‍ය ප්‍රතිපාදන ලැබෙන අවස්ථාවේදී ප්‍රමාදයකින් තොරව අදාළ කාල පරාසය තුළ ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතු වේ. | ඇතැම් ව්‍යාපෘති වර්ෂ අවසානයේ ලබාදෙනු ලබන නිසාත්, එවකට වැසි සමය නිසාත් අත්හැර දමන ලදී. |
| (ආ) | 2018 වර්ෂය සඳහා ගම් පෙරළිය වැඩසටහන සඳහා සලසා තිබූ ප්‍රතිපාදනවලින් ක්‍රියාත්මක කළ යුතුව තිබූ ව්‍යාපෘති 60 කින් රු.මිලියන 6.57 ක් වටිනා ව්‍යාපෘති 06 ක් මන්නාරම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කර නොතිබුණි. | අදාළ මූල්‍ය ප්‍රතිපාදන ලැබෙන අවස්ථාවේදී ප්‍රමාදයකින් තොරව අදාළ කාල පරාසය තුළ ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතු වේ. | පිළිගෙන ඇත. ඇතැම් ව්‍යාපෘති වර්ෂ අවසානයේ ලබාදෙනු ලබන නිසාත්, එවකට වැසි සමය නිසාත් අත්හැර දමන ලදී. |

**3.2 අපේක්ෂිත ප්‍රතිලාභ ළඟා කරගත නොහැකි වීම**

මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉටු කළ කාර්යයන්වලින් අපේක්ෂිත ප්‍රතිලාභ ලබාගත නොහැකි වීම පිළිබඳ නිරීක්ෂණයන් පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 වර්ෂයේ වැවත් සමහ ගම්මාන සංවර්ධන වැඩසටහන් කාර්යභාරයන් සම්බන්ධයෙන් රු.2,910,000 ක වියදමින් මන්නාරම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉදිකර තිබූ එරික්කලම්පිටිය මුහුදු මාර්ගය සහ එරික්කලම්පිටිය ආමෙයිපඩුක්කෙයි පඩගුතුරෙයි මාර්ගය සම්බන්ධයෙන් සත්‍ය වශයෙන් නිමකළ කාර්යයන්ගේ මිනුම්වල හා ගෙවීම් අතර රු.1,674,732 ක වැඩිපුර වෙනසක් නිරීක්ෂණය විය. | විධිමත් විමර්ශනයන් ක්‍රියාත්මක කර වැඩිපුර මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | විමර්ශනයන් සිදුකර වැඩිපුර ගෙවීම් ආපසු අයකර ගැනීමට කටයුතු කෙරෙමින් පවතී. |

**3.3 ප්‍රසම්පාදනය**

මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සිදුකරන ලද ප්‍රසම්පාදනයන් පිළිබඳ නිරීක්ෂණයන් පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයේ ජීවනෝපාය වැඩසටහන (2016) සම්බන්ධයෙන්, 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.3 සිට 6.3.7 දක්වා වූ මාර්ගෝපදේශ අනුව ප්‍රසිද්ධ මිල කැඳවීම් පරිපාටිය අනුගමනය නොකර වර්ග 03 ක ජීවනෝපාය ආධාර වැඩසටහන් සඳහා රු.22,000,000 ක් වටිනා පශු සම්පත් සහ තහඩු ආදිය මිලදී ගෙන තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අත්පොතේ කරුණු සම්බන්ධයෙන් අවධානය යොමුකර ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කළ යුතුය. | පිළිගෙන ඇත. ඉදිරියේදී මෙවැනි දෝෂ සිදු නොවන අයුරින් අදාළ නිලධාරීන්ට ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ දැනුම වර්ධනය කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව විසින් රු.මිලියන 10 ක් දක්වා ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමට අවසරය ලබා දී තිබුණි. එසේ වුවත්, ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට පටහැනිව රු.මිලියන 22 ක් වටිනා පශු සම්පත් ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් අනුගමනය නොකර නානාට්ටාන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මිලදී ගෙන තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අත්පොතේ කරුණු සම්බන්ධයෙන් අවධානය යොමුකර ප්‍රසම්පාදනය ක්‍රියාවලිය ක්‍රියාත්මක කළ යුතුය. | පිළිගෙන ඇත. ඉදිරියේදී මෙවැනි දෝෂ සිදු නොවන අයුරින් අදාළ නිලධාරීන්ට ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ දැනුම වර්ධනය කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| (ඇ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1(ආ) මාර්ගෝපදේශය ප්‍රකාරව රු.500,000 කට වැඩි මිලදී ගැනීම් සඳහා ගිවිසුම් සඳහා එළැඹිය යුතු බව සඳහන් කර තිබුණත් එයට පටහැනිව කිරි ගවයින්, එළුවන්, කිකිළි පැටවුන් සහ තහඩු ආදිය මිලදී ගෙන බෙදාහැරීම සඳහා නානාට්ටාන්, මුසලි පශු සම්පත් අභිජනන සමුපකාර සමිතිය සමඟ (Livestock Breeder's Co-operative Society) ගිවිසුම්වලට නොඑළඹ නානාට්ටන් ප්‍රා දේශීය ලේකම් කාර්යාලය විසින් රු.මිලියන 22 ක ගෙවීම් සිදු කර තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අත්පොතේ කරුණු සම්බන්ධයෙන් අවධානය යොමුකර ප්‍රසම්පාදනය ක්‍රියාවලිය ක්‍රියාත්මක කළ යුතුය. | පිළිගෙන ඇත. ඉදිරියේදී මෙවැනි දෝෂ සිදු නොවන අයුරින් අදාළ නිලධාරීන්ට ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ දැනුම වර්ධනය කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| (ඈ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව විසින් රු.10,000,000 ක් දක්වා ප්‍රසම්පාදනය කිරීමට අවසර ලබා දී තිබුණි. එසේ වුවත්, රු.15,499,800 ක් වටිනා පශු සම්පත් සහ අනෙකුත් මිලදී ගැනීම් සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය නොකර මාන්තායි බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මිලදී ගැනීම් සිදුකර තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අත්පොතේ කරුණු සම්බන්ධයෙන් අවධානය යොමුකර ප්‍රසම්පාදනය ක්‍රියාවලිය ක්‍රියාත්මක කළ යුතුය. | පිළිගෙන ඇත. ඉදිරියේදී මෙවැනි දෝෂ සිදු නොවන අයුරින් අදාළ නිලධාරීන්ට ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ දැනුම වර්ධනය කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| (ඉ) | මිල ගණන් කැඳවීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් භාණ්ඩ හා සේවා සඳහා මිල ගණන් කැඳවීමේ කමිටු තීරණ විගණන පරීක්ෂාවට ලක් කිරීමේදී මිල ගණන් කැඳවීමේ කමිටු තීරණ ගත් සභාපති සහ සාමාජිකයන් වශයෙන් අනාවරණය කරනු ලැබූ නිලධාරීන් | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අත්පොතේ කරුණු සම්බන්ධයෙන් අවධානය යොමුකර ප්‍රසම්පාදනය ක්‍රියාවලිය ක්‍රියාත්මක කළ යුතුය. | පිළිගෙන ඇත. ඉදිරියේදී මෙවැනි දෝෂ සිදු නොවන අයුරින් අදාළ නිලධාරීන්ට ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ දැනුම වර්ධනය කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇත. |

| | | | |
|---|---|---|---|
| | පුද්ගලික නිවාඩු, රාජකාරී නිවාඩු, ක්ෂේත්‍ර රාජකාරී කාලය තුළදීත් මිල ගණන් කැඳවීමේ කමිටු තීරණ ගත් දිනය හා වේලාවන්වලදී ඒවා ඉටුකරන අවස්ථාවේදී නිවාඩු ලබා සිටි මොහොතේත් පැමිණ සිටි බවටත්, නිවාඩු දිනවලත්, කාර්යාලයට පැමිණි බවට කිසියම් ලේඛනයක හෝ පැමිණීමේ ලේඛනයේ අත්සන් කර නොතිබූ නමුත් මිල ගණන් කැඳවීමේ කමිටු තීරණ ගෙන තිබීම මිල ගණන් කැඳවීමේ කමිටු තීරණවල සත්‍යභාවය විගණනයේදී තහවුරු කළ නොහැකි විය. | | |
| (ඊ) | මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2018 වර්ෂයේ ස්වදේශ කටයුතු අරමුදල් උපයෝජනය කර රු.මිලියන 9.4 ක ඇස්තමේන්තුවක් මත වාහන නැවතුම්පළක්, තාක්ෂණික උද්‍යාන, සාකච්ඡා මණ්ඩප ඉදිකිරීම් සම්බන්ධයෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.4 මාර්ගෝපදේශය අනුව තාක්ෂණික ඇගයීම් කමිටුව 03 සිට 05 දක්වා සාමාජික සංඛ්‍යාවකින් විය යුතුය. එසේ වුවත්, මෙයට පටහැනිව රු.මිලියන 9.4 ක් වටිනා මෙම කාර්යයන් සම්බන්ධයෙන් එක් පුද්ගලයෙකු පමණක් තාක්ෂණික කමිටු සාමාජිකයෙකු ලෙස තෝරා ගෙන තිබූ අතර මෙම තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය අනුව සැපයුම්කරු තෝරා පත් කර ගැනීම ද පටහැනි කරුණක් ලෙස නිරීක්ෂණය විය. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව තාක්ෂණික ඇගයීම් කමිටු පත් කළ යුතුය. | පිළිගෙන ඇත. ඉදිරියේදී මෙවැනි ප්‍රසම්පාදන ක්‍රියාවලීන්ට පටහැනි කාර්යයන් වලකාලනු ලැබේ. |

## 3.4 වත්කම් කළමනාකරණය

මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වත්කම් කළමනාකරණය සම්බන්ධයෙන් අනාවරණය වූ නිරීක්ෂණයන් පහත පරිදි වේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 05 ක පරිපාලන ප්‍රදේශයේ පිහිටි එකතුව රු.334,900,000 ක් වටිනා නිවාස සංකීර්ණ ගොඩනැගිලි 33 ක් එකී නිවාස අයිතිකරුවන් විසින් නඩත්තු නොකිරීම නිසාත්, වෙනත් ස්ථානවල පදිංචිව සිටින නිසාත් එමෙන්ම නුසුදුසු පහත් ප්‍රදේශවල නිවාස සංකීර්ණ ඉදිකර තිබූ නිසාත් වර්ෂ 01 සිට වර්ෂ 09 ක් දක්වා මෙම ගොඩනැගිලි නිෂ්කාර්යව හානියට පත් වී තිබුණි. | නිවාස සංකීර්ණ පිළිබඳව පූර්ව අධ්‍යයනයක් සිදු කළ යුතුය. තවද, මේවා භාවිතා නොකිරීමට හේතු විමර්ශනය කළයුතු අතර භාවිතා කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ගද ගත යුතු වේ. | පිළිගෙන ඇත. විවිධ වූ පුද්ගලික හේතු කාරණා නිසා අදාළ ඉඩම්වල පදිංචි වී නොතිබුණි. |
| (ආ) | මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රා දේශීය ලේකම් කාර්යාල 05 ක භාවිතයේ හා පාලනයේ පවතින එකතුව රු.30,358,345 ක් වටිනා ගොඩනැගිලි, යන්ත්‍ර සංඛ්‍යා 17 ක් වර්ෂ 02 සිට 07 දක්වා නිෂ්කාර්යව පැවතුණි. | ආර්ථික අරමුණු අත්කරගැනීම සඳහා මේවා උපයෝජනය කළ යුතු වේ. | හානියට පත් ගොඩනැගිලි අලුත්වැඩියා කිරීමටත්, මූලික පහසුකම් නොමැති ගොඩනැගිලි සඳහා පහසුකම් ලබාදීමේදීත් මුළුමනින්ම උපයෝජනය කිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. |

## 3.5 ආර්ථික නොවූ ගනුදෙනු

මන්නාරම  දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ආර්ථික නොවූ ගනුදෙනු සම්බන්ධයෙන් හෙළිදරව් වූ නිරීක්ෂණයන් පහත පරිදි වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කිරි ගවයින් ලබා දී තිබූ ප්‍රතිලාභීන්ගෙන් මාන්තායි බටහිර ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ප්‍රතිලාභීන් 05 දෙනෙකු ප්‍රමාණවත් ප්‍රතිලාභ අත් නොවූ බැවින් තමන්ට ලබා දී තිබූ ගවයින් විකුණා වෙනත් ගවයින් මිලදී ගනු ලැබූ බව ප්‍රතිලාභීන් විසින් තහවුරු කරන ලදී. | සැලසුම් නිසියාකාරව ක්‍රියාත්මක කළ යුතුය. | පිළිගෙන ඇත. ඉදිරියේදී නියමිත ආකාරයෙන් ජීවනෝපාය ආධාර කටයුතු ක්‍රියාත්මක කිරීමට උපදෙස් ලබා දී ඇත. |

## 3.6 පිළිතුරු නොලත් විගණන විමසුම්

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ලබා නොදුන් විගණන විමසුම් පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විගණන විමසුම් 07 ක් සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක් විසින් මාස 01 සිට මාස 08 ක් දක්වා කාලය තුළ පිළිතුරු ලබා දී නොතිබුණි. | පිළිතුරු ලබා නොදුන් විගණන විමසුම්වලට නියමිත කාලය තුළ පිළිතුරු සැපයීමට කටයුතු කළ යුතුය. | අනාගතයේදී මේවා වලක්වනු ලැබේ. |

## 3.7 කළමනාකරණ අකාර්යක්ෂමතා

මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කළමනාකරණ අකාර්යක්ෂමතා පිළිබඳ නිරීක්ෂණයන් පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කුඩා ඇඟළුම් කර්මාන්ත පිහිටු වීම සඳහා මහන මැෂින් ලබාදීම, හැකියාවන් පිළිබඳව, හස්ත කර්මාන්ත සහ වානිජ අමාත්‍යාංශ ලේකම්වරයාගේ අංක MIC/SME/TEX/04/01 දරන 2016 ජුනි 23 දිනැති ලිපිය මඟින් දිස්ත්‍රික් ලේකම් මාර්ගයෙන් පුහුණුකරුවන්, ප්‍රතිලාභීන් සහ මුරකරුවන් ආදිය තෝරා යැවිය යුතු බවට දන්වා තිබූ නමුත් මන්නාරම දිස්ත්‍රික්කයේ මන්නාරම නගරය, නානාට්ටන්, මාන්තායි බටහිර, මඩු සහ මුසලි යන ප්‍රාදේශීය කාර්යාල 05 ක් පැවතුණද මන්නාරම නගර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පමණක් මැහුම් පුහුණු මධ්‍යස්ථාන 14 ක් හා නානාට්ටන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ එක් මැහුම් පුහුණු මධ්‍යස්ථානයක් තෝරාගෙන තිබීම, අවිධිමත් ප්‍රතිලාභීන් තේරීමකි. | සැලසුම් සම්බන්ධයෙන් පූර්ව අධ්‍යයනයක් සිදුකර එයට අනුකූලව ප්‍රතිලාභීන් තෝරා ගැනීම සිදු විය යුතු වේ. | පිළිගෙන ඇත. අදාළ අමාත්‍යාංශ විසින් තෝරා පත් කළ ප්‍රතිලාභීන්ගේ ලැයිස්තුව සඳහා මැහුම් පුහුණුව ලබා දී තිබුණි. |
| (ආ) | කුඩා ඇඟළුම් කර්මාන්ත පිහිටු වීම සඳහා මධ්‍යස්ථාන 15 කට මහන මැෂින් ලබාදීම, හැකියාවන් පිළිබඳව, හස්ත කර්මාන්ත සහ වානිජ අමාත්‍යාංශ ලේකම්වරයාගේ අංක | අවම වශයෙන් සුදුසුකම් සහිත අය තෝරා පත් කළ යුතුය. තවද, මෙම කරුණු සම්බන්ධයෙන් විමර්ශන කටයුතු සිදු කළ යුතු වේ. | පිළිගෙන ඇත. අදාළ අමාත්‍යාංශය විසින් තෝරා ගනු ලැබූ පුහුණුකරුවන්ගේ ලැයිස්තුව අනුව මැහුම් පුහුණුව ලබා දී තිබුණි. |

| | | | |
|---|---|---|---|
| | MIC/SME/TEX/04/01 දරන 2016 ජුනි 23 දිනැති ලිපියට පටහැනිව තෝරා පත් කළ පුහුණුකරුවන් තිදෙනෙකු ඉන්දියාවේ ඉගෙනුම ලැබූ අය වන අතර ශ්‍රී ලංකාවේ විභාග දෙපාර්තමේන්තුවේ අ.පො.ස.(සා/පෙ) විභාගය සඳහා පෙනී සිට නොමැත. | | |
| (ඇ) | මාන්තායි බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කළමනාකරණ සහකරුගේ රු.මිලියන 2.5 ක චෙක්පත් වංචාව සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගිණුම් අංශය විසින් භාවිතා කරනු ලබන සිගාස් පරිගණකගත කරනු ලැබූ ගිණුම් ක්‍රමය සඳහා රහස් වචන කාර්යාලයේ සේවකයන් භාවිතා කිරීම සඳහා එකකුත් ප්‍රධාන පාලන අධීක්ෂණය කිරීම සඳහා වගකිව යුතු නිලධාරියෙකුට එකකුත් වශයෙන් ලබා දී තිබුණි. එසේ වුවත්, නිශ්චිත එක් නිලධාරියෙකුට පමණක් මෙම රහස් වචන දෙකම පරිහරණය කිරීමට අවසරය ලබා දී තිබීමත්, මුදල් ගෙවීම් කිරීම සහ බැංකු ගිණුම් වෙහෙසවීමේ වගකීම සඳහා අවසරයද ලබා දී තිබීමත් අභ්‍යන්තර පාලනයේ දූර්වලතාවය නිරූපනය කෙරුණි. | අභ්‍යන්තර පාලන ක්‍රියාපටිපාටිය ශක්තිමත් කළ යුතුය. තවද, අදාළ පුද්ගලයන්ට රාජකාරී බෙදා දිය යුතුය. | පිළිගෙන ඇත. වගකිව යුතු නිලධාරියාට උපදෙස් ලබා දී අභ්‍යන්තර පාලන කටයුතු සම්බන්ධයෙන් තදින් අවධානය යොමු කිරීමට උපදෙස් ලබා දී ඇත. |
| (ඇ) | බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයේ ජීවනෝපාය ආධාර වැඩසටහන 2016 වර්ෂයේදී රු.මිලියන 22 කට නානාට්ටන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කළ වැඩසටහන සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (i) | කිරි ගවයින් 151 දෙනෙකු රක්ෂණය කර තිබූ නමුත්, නියැදි පරීක්ෂණ පදනමින් ප්‍රතිලාභීන් 83 දෙනෙකුගේ කිරි ගවයින් ඍජු පරීක්ෂාවට භාජනය කළ විට ප්‍රතිලාභීන් 23 දෙනෙකුගේ ගවයන් මියගොස් තිබූ නමුත් ප්‍රතිලාභීන් දෙදෙනෙකුට පමණක් රක්ෂණ වන්දි පිරිනමා තිබුණි. ඉතිරි | රක්ෂණ වන්දි නියමිත ප්‍රතිලාභීන්ට ලබාදීමට වගකිව යුතු නිලධාරීන් සහතික විය යුතු වේ. | පිළිගෙන ඇත. මෙම ක්‍රියාවන්වල යෙදී සිටින පාඩු සිදු වී තිබුණු ප්‍රතිලාභීන්ට රක්ෂණ වන්දි ලබාදීමට කටයුතු කර ඇත. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රතිලාභීන් 21 දෙනාටම රක්ෂණ වන්දි ලබා දී නොතිබීම මගින් රක්ෂණය කිරීමේ අරමුණ ඉටු වී නොතිබුණු අතර ප්‍රතිලාභීන්ට පාඩු සිදු වී තිබුණු බව නිරීක්ෂණය විය. | | |
| (ii) | ප්‍රතිලාභීන් 22 නෙකුට ලබාදුන් එළුවන් රක්ෂණය කර තිබුණු අතර නියැදි විගණන පරීක්ෂාවේදී ප්‍රතිලාභීන් 20 දෙනෙකුගේ එළුවන් භෞතික පරීක්ෂාවට ලක් කිරීමේදී ප්‍රතිලාභීන් 13 දෙනෙකුගේ එළුවන් 20ක සංඛ්‍යාවක් මිය ගොස් තිබුණි. එනමුත් කිසිදු ප්‍රතිලාභියෙකුට රක්ෂණ වන්දි ලැබී නොතිබුණි. මේ අනුව රක්ෂණය කිරීමේ අරමුණ ඉටු වී නොතිබුණු අතර ප්‍රතිලාභීන්ට පාඩු සිදු වී තිබූ බව නිරීක්ෂණය විය. | රක්ෂණ වන්දි නියමිත ප්‍රතිලාභීන්ට ලබාදීමට වගකිව යුතු නිලධාරීන් සහතික විය යුතු වේ. | ප්‍රතිලාභීන් විසින් නියමිත කාල වකවානුවල ප්‍රතිශක්තිකරණ එන්නත් වැනි නඩත්තු පහසුකම් ක්‍රියාත්මක නොකිරීම නිසාත් අවම පශු සම්පත් ප්‍රමාණයක් වෛද්‍ය පරීක්ෂාවන්ට ලක් කිරීමත් නිසා ප්‍රතිලාභීන්ට රක්ෂණ වන්දි ලබාදීමේ දුෂ්කරතා පැවතුණි. |

## 4. යහපාලනය

### 4.1 මහජනතාවට සේවාවන් ඉටුකිරීම

මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් මහජනතාවට සේවාවන් ඉටු කිරීමේදී පැවති දුර්වලතා පහත පරිදි නිරීක්ෂණය විය.

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (අ) | මන්නාරම දිස්ත්‍රික් මූසලී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සිලාවතුර ගම්මානයේ රජයේ ඉඩම් එවකටත් ප්‍රතිලාභීන් 18 දෙනෙකුට ලබාදීමට අනුමත කිරීමෙන් පසුව, ඔවුන්ගේ ඉල්ලීම් කිසිදු හේතුවකින් තොරව ප්‍රතික්ෂේප කොට SL Aquatic Information (Pvt) Ltd. යන පුද්ගලික ආයතනයට ජල ජීවී අභිජනනය සඳහා දිගුකාලීන බදු පදනමින් ලබා දී තිබීම ආසාධාරණ (ඉල්ලීම්) තේරීමකි. | අදාළ විමර්ශනයන් ක්‍රියාත්මක කර නියමිත ප්‍රතිලාභීන්ට ලබාදීමට කටයුතු කළ යුතුය. | කමිටු ස්ථාපිත කර මූලික විමර්ශන කටයුතු ක්‍රියාත්මක කර අමාත්‍යාංශය දැනුවත් කර ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයේ ජීවනෝපාය වැඩසටහන සඳහා ප්‍රතිලාභීන්ට රු.90,000 ක වටිනාකමට කිරි ගවයන් මිලදී ගත යුතු බව නානාට්ටාන් මූසලි පශු සම්පත් අභිජනන සමූපකාර සංගමයට (LIBCO) ගෙවීම් සිදු කර තිබුණත් ප්‍රතිලාභීන් 07 දෙනෙකුට අදාළ වටිනාකමට වඩා අඩු වටිනාකමින් යුත් කිරි ගවයින් මාන්තායි බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මිලදී ගෙන ලබාදී තිබුණි. | වැය කරන මුදලට සරිලන ප්‍රතිලාභ තහවුරු කර මිලදී ගැනීම් සිදු විය යුතු වේ. | අවිධිමත් මෙම ගෙවීම් පිළිබඳ ප්‍රාදේශීය ලේකම්වරයාගෙන් වාර්තාවක් ඉල්ලා ඇත. |